**ඉඩම් මැනුම් සභාව - 2022**

**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඉඩම් මැනුම් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 2002 අංක 17 දරන මැනුම් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 27 වන ඡේදය ප්‍රකාරව ගිණුම් ප්‍රතිපත්තියක වෙනස්වීම අතීතානුයෝගීව ව්‍යවහාර කළවිට එම අලුත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය පෙර සිට ව්‍යවහාර කළාසේ සලකා අස්තිත්වය ඉදිරිපත් කරනු ලබන පැරණිම පෙර කාලපරිච්ඡේදය සහ ඉදිරිපත් කරනු ලබන අනෙක් සියලුම පෙර කාලපරිච්ඡේද සඳහා ශුද්ධ වත්කම්වල/ ස්කන්ධයේ ඇති බලපෑමට යටත්වන සෑම සංරචකයකම ආරම්භක ශේෂය ගැලපිය යුතුය. ඒ අනුව පසුගිය වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ගණනය මුදල් පදනමටද සමාලෝචිත වර්ෂයේදී එම ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කර උපචිත පදනම යොදාගැනීම නිසා සමුච්චිත අරමුදලෙහි ආරම්භක ශේෂයට එකතු කළයුතු රු. 153,581 ක් මෙම වර්ෂය තුළදී ලද ආදායමක් ලෙස සලකා ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පතු පොලී ආදායම රු. 153,581කින් අධිතක්සේරු වී තිබුණි. | සභාවේ මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමට පිළියෙල කරනු ලබයි. 2021 මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර තැන්පතු පොලී ආදායම හඳුනා ගැනීමේදී පමණක් මුදල් පදනම භාවිතා කර ඇත. 2022 වර්ෂයේ සිට ඉදිරියට ස්ථාවර තැන්පතු පොලී ආදායම උපචිත පදනම මත ගිණුම් තැබීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 34 වන ඡේදය ප්‍රකාරව ස්ථාවර තැන්පතු පොලිය මුදල් පදනමේ සිට උපචිත පදනමට වෙනස් කිරීමේ ප්‍රතිපත්ති වෙනස්වීමට අදාළව සිදුකළ යුතු ප්‍රවර්ථන කාලපරිච්ඡේදය සහ ඉදිරිපත් කර ඇති එක් එක් පෙර කාලපරිච්ඡේදය සඳහා | 2021 වර්ෂයට ඇතුළත් විය යුතු පොලී ආදායම ද 2022 වර්ෂයේ ලැබීම් ලෙස සලකා පොලී ආදායම ගණනය කිරීම හේතුවෙන් 2022 වර්ෂයේ පොලී ආදායම වැඩිපුර හඳුනාගැනීම සිදුවී ඇත. 2022 වර්ෂ අවසානයේ ස්කන්ධයට මෙමඟින් බලපෑමක් සිදුවී නොමැති බව පෙන්වා | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රායෝගික වනතාක් දුරට බලපෑමක් ඇති වූ එක් එක් මූල්‍ය ප්‍රකාශන රේඛීය අයිතම සඳහා වන බලපෑම සහ ප්‍රායෝගික වනතාක් දුරට ප්‍රවර්ථන කාලපරිච්ඡේදය සහ ඉදිරිපත් කර ඇති සෑම පූර්ව කාලපරිච්ඡේදයක් සඳහා වන ගැලපුම් අගය යන හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශය තුළ සිදුකොට නොතිබුණි. | දෙමි.<br>නමුත් සභාව සතුව වර්ෂයකට වඩා වැඩි කාලයක් පවතින ස්ථාවර තැන්පතු නොපවතින බැවින් තැන්පතු පොලී හඳුනාගැනීමේ පදනම වෙනස්වීම මත පෙර කාලපරිච්ඡේදයට හෝ අනාගත කාලපරිච්ඡේදවලට බලපෑමක් ඇති නොවන බැවින් මෙම කරුණු හෙළිදරව් කිරීම අවශ්‍ය නොවන බව පෙන්වා දෙමි. | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08 හි 36 වන වගන්තිය ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කළ යුතු වුවද, ඉඩම් මැනුම් සභාව විසින් මිනින්දෝරුවරයෙකුගේ බලපත්‍රය අවලංගු කිරීමට එරෙහිව එම මිනින්දෝරුවරයා විසින් අභියාචනාධිකරණය වෙත ගොනුකර තිබෙන අංක CA/MISC/04/16 දරන නඩුව පිළිබඳව මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කර නොතිබුණි. | මැනුම් සභාවෙන් වන්දි හෝ වෙනත් මූල්‍ය ඉල්ලීමක් සිදුකර මෙම නඩුව පවරා නොමැත.මැනුම් පනතේ 49 වගන්තිය අනුව නඩු කටයුතු සිදුවේ. මැනුම් සභාවට එරෙහිව මෙවැනි නඩු කිහිපයක් දැනට විභාගවන අතර එමගින් ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා හැකියාවන් සහිත සම්පත් පිටතට ගලායාමක් සිදු නොවන බැවින් මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කිරීම අවශ්‍ය නොවන බව පෙන්වා දෙමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි අවසාන තොගයෙහි වටිනාකම රු.383,348 ක් ලෙස සටහන් වුවද, අවසාන තොග ගණනය කිරීමේ වාර්තාව පරිදි එහි වටිනාකම රු.294,263 ක් වූ හෙයින් රු. 89,085 කින් තොගය අධිගණනය වී තිබුණි. | 2022පෙබරවාරි 07 දින හා නොවැම්බර් 22 දින වලදි මිළදීගත් ටෝනර්ස් හතරක සම්පූර්ණ අගය වූ රු. 89,085 ක් පාරිභෝජ්‍ය භාණ්ඩ ලේඛනයෙහි හා අවසන් තොග ගණනය කිරීමේ වාර්තාවෙහිද මෙම වටිනාකම ඇතුළත් වී නොමැති අතර 2022.12.31 දිනට වාර්ෂික මූල්‍ය ප්‍රකාශයන්හි අවසන් තොගය දැක්වීමේදී එම අගය ඇතුළත් කර තොගයෙහි වටිනාකම රු.383,348 ක් ලෙස දක්වා ඇති බව පෙන්වා දෙමි. | අවසාන තොගයේ නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ලැබිය යුතු ආදායම් ශේෂය රු. 627,169 ක් වුවද, ඊට අදාළ අංක 05 දරන විස්තරාත්මක සටහනෙහි රු.708,846 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු. 81,677 ක වෙනසක් නිරීක්ෂණය විය. | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය ගණනයේදි ඇති වූ දෝෂයක් නිසා රු. 81,677 ක් වැඩිපුර මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා පසුව එය හඳුනාගෙන නිවැරදි කරන ලදි. නමුත් අවසන් මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 5 ට අදාළව එම අගය නිවැරදි කිරීමට අතපසු වී ඇත. ලැබිය යුතු ආදායම සමස්ත ශේෂය ද රු. 627,169 ක් ලෙස නිවැරදි විය යුතුය. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සහ ඊට අදාළ විස්තරාත්මක සටහනෙහි ශේෂ සමාන විය යුතුය. |
| (ඇ) | ආදායම් ලෙජර ගිණුම තුළ, ඉදිරියට ලද බලපත්‍ර ආදායම රු. 7,469,912 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් අංක 08 යටතේ එම ආදායම රු. | ලෙජරයෙහි ලැබිය යුතු රු. 74,800 ක මුදල අඩු වූ පසුව තනිපුද්ගල ගිණුම්වල ශේෂය රු.8,453,362 ක් ලෙස දැක්වෙන අතර එම මුදල ද ඇතුළත් වන පරිදි ඉදිරියට ලද ආදායම් ගිණුම සකස් වී ඇති ආකාරය මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 8 මගින් දක්වා | බලපත්‍ර ආදායම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනයෙහි හා සටහන් අංක 08 යටතේ පෙන්විය |

| | | | |
|---|---|---|---|
| | 7,395,112 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.74,800 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඇත. එහිදී මිනින්දෝරුවරුන්ගෙන් ලැබිය යුතු රු.74,800 ක මුදල ද එකතුකර ඉදිරියට ලද සමස්ත ආදායම් ශේෂය වු රු. 8,528,162 ක මුදල දක්වා ඇති බව පෙන්වා දෙමි. | යුතුය. |
| (ඇ) | 2022 පෙබරවාරි මස විශ්‍රාම ගිය නිලධාරිනියකට පාරිතෝෂික මුදල ලෙස රු.121,240 ක් 2022 මාර්තු 24 දින ගෙවා අදාළ පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුමෙන් ඒ සදහා රු. 114,542 ක් පමණක් අඩුකිරීම කර තිබුණි. ඒ අනුව වෙනස රු. 6,698 ක් විය. තවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහිද පාරිතෝෂික ගෙවීම් ලෙස රු. 114,542 ක් පමණක් දක්වා තිබුණි. | 2022 වර්ෂය ආරම්භයේදී වැටුප් වර්ධක ලබා දීම මත මූලික වැටුප වෙනස් වී ඇති අතර ඊට අදාළව පාරිතෝෂික ගණනය කිරීමේදී ගෙවිය යුතු පාරිතෝෂික මුදල රු. 121,240 ක් විය. 2022 මාර්තු මස එම මුදල ගෙවීමේදී ඒ වන විට පාරිතෝෂික ගෙවීම වෙන් කර තිබූ රු. 114,542 ක මුදල වෙන් කිරීමේ ගිණුමෙන් අඩු කර ගෙවිය යුතු සම්පූර්ණ මුදල සහ වෙන් කර තිබූ මුදලෙහි වෙනස වූ රු. 6,698 ක මුදල වෙනත් වියදම් යටතේ 2022 වර්ෂයේ ලාභයට එරෙහිව ගලපා ඇත. | පාරිතෝෂික ගෙවීමට පෙර අදාළ වෙන් කිරීම් කළ යුතුය. |
| (ඉ) | මැනුම් පනතෙහි 47 (3) වගන්තිය ප්‍රකාරව මිනින්දෝරුවරයකු වෘත්තීය විෂමාචාරයට වරදකරු වී ඇතිවිට, ඔහු විසින් සභාවට ගෙවිය යුතු සියලු ගාස්තු හා වියදම් සභාවට අයවිය යුතු ණයක් වශයෙන් අයකරනු ලැබියයුතු වුවද, ලියාපදිංචිය අවලංගු කරන ලද අංක 19891607 දරන මිනින්දෝරුවරයාගේ නම ගැසට්පත්‍රයේ පළකිරීම වෙනුවෙන් සභාව විසින් වියදම් කරන ලද රු.5,908 ක මුදල අදාළ මිනින්දෝරුවරයාගෙන් අයකරගෙන නොතිබුණ අතර එය ණයගැති ශේෂයක් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන්ද හෙළිදරව් කර නොතිබුණි. | අදාළ වගඋත්තරකාර මිනින්දෝරුවරයා සිදුකරන ලද වෘත්තීය විෂමාචාරය වෙනුවෙන් සභාව සිදු කරන ලද විධිමත් පරීක්ෂණය අනුව ඔහුගේ 2023.01.01 සිට 2025.12.31 දක්වා ලියාපදිංචිය අවලංගු කර ඇත. (වාර්ෂික බලපත්‍රයද අවලංගු වේ.) ලියාපදිංචිය අවලංගු කිරීමට අදාළව ඔහුගේ නම ගැසට් පත්‍රයේ පලකිරීම වෙනුවෙන් සභාව විසින් දරන ලද වියදම් ද ඔහුගෙන් අය කර ගැනීම, ඔහුට ලබා දෙන දඬුවම් දෙකක් වන බැවින් එය අය කර නොගැනීමට කටයුතු කර ඇත. | මැනුම් පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | පසුගිය වර්ෂයේ බලපත්‍ර ඉල්ලුම් කළ අයදුම්කරුවන්ට බලපත්‍ර නිකුත් නොකිරීම හේතුවෙන් පසුගිය වර්ෂයේ දෙසැම්බර් 31 දිනයෙන් ඉදිරියට ගෙන එන ලද බලපත්‍ර ආදායම රු.5,111,652 ක් වූ අතර සමාලෝචිත වර්ෂයෙන් ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම රු.7,469,912 ක් විය.මෙම ශේෂ අතර | මිනින්දෝරු බලපත්‍ර ලබා ගැනීම හැර වෙනත් හේතු මත ගෙවන මුදල් රු.788,740 ක් ඉතිරිව ඇත. මෙම මුදල් ඔවුන් වෙත නැවත ගෙවීම සඳහා 2023.04.21 දින පැවති 317 රැස්වීම් වාරයේදී අනුමැතිය ලැබී එම මුදල් නැවත ගෙවීම් කටයුතු සිදු කරමින් පවතින අතර මිනින්දෝරුවරුන් විසින් බලපත්‍ර ලබා ගැනීමට එරෙහිව විභාග වන නඩුව 2023.05.29 දින පැවැත්වෙන අතර එහිදී ලැබෙන තීන්දුව ද සලකා බලා 2023 වර්ෂය තුළ මෙම තනිපුද්ගල ගිණුම් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරන බව පෙන්වා | ලැබීම් හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | රු.1,879,710 ක් වර්ෂ දෙකේදීම නොවෙනස්ව පැවති අතර ඉන් රු.1,356,600 ක් සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර ලබාගැනීමට අයදුම් කරුවන් 357 දෙනෙකු විසින් පසුගිය වර්ෂයේදී ගෙවන ලද ගාස්තු වන අතර ඔවුන්ට සමාලෝචිත වර්ෂයේදීද බලපත්‍ර නිකුත්කොට නොතිබුණි. එසේම ඉතිරි ශේෂය වූ රු.523,110 කුමක් සඳහා වූ ලැබීමක් ද යන්න නිශ්චිතවම හඳුනාගෙන නොතිබුණි. | දෙමි. | |
| (උ) | පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද රු. 186,150 ක හඳුනා නොගත් ලැබීම් ශේෂයක් නිශ්චිතව හඳුනාගෙන නොතිබියදී සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සලකා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට බැර කර තිබුණි. | සේවාවක් සඳහා ඉල්ලීමක් හෝ රිසිට්පතක් ඉදිරිපත් නොවන ලැබීම් හඳුනා ගැනීමට කිසිඳු හැකියාවක් නොමැති බැවින් ඉඩම් මැනුම් සභාව විසින් වර්ෂය අවසානයේදී ගනු ලබන තීරණයක් අනුව අදාළ හඳුනා නොගත් ලැබීම් වර්ෂයේ ආදායමට බැර කිරීම සිදු කරයි. 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී ද මෙසේ හඳුනා නොගත් ලැබීම් ලෙස රු. 186,150 ක මුදලක් ආදායමට ගෙන ඇත. | ලැබීම් නිවැරදිව හඳුනාගැනීමේ ක්‍රම වේදයක් බැංකුව සමඟ සාකච්ඡා කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 23 (1) (අ) වගන්තිය | තොරතුරු නිලධාරියකු පත් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | සභාවට තොරතුරු නිලධාරියකු පත් කළ යුතුය. |
| (ආ) | 2002 අංක 17 දරන මැනුම් පනත | | | |
| | (i) 32 (1) වගන්තිය | 2002 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සභාවට ස්ථිර ලේකම්වරයෙකු පත් කරගෙන නොතිබුණි. | ලේකම්වරයකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) 37 වගන්තිය | (උ) | ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව, පිළිගැනීම යන කරුණුවලදී සම තත්ත්වයක් සහ අන්‍යෝන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමඟ අන්‍යෝන්‍ය වැඩ පිළිවෙලවල් සඳහා එකඟතාවය ඇති කර ගැනීම ක්‍රියාත්මක කිරීම සභාවේ කර්තව්‍යයක් වුවද එය සිදුකර නොතිබුණි. | මෙතෙක් විදේශීය ආයතන සමඟ එසේ කටයුතු කර නොමැත. | විදේශීය රටවල් සමඟ අන්‍යෝන්‍ය වැඩ පිළිවෙලවල් සඳහා එකඟතාවය ඇති කර ගත යුතුය. |
| (iii) 38 වගන්තිය | (ඇ) | සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම සිදුකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එහි ස්ථිර කාර්ය මණ්ඩලය එක් කළමනාකරණ සේවා නිලධාරිනියක හා එක් කාර්යාල සහායකවරයෙකුට සීමා වී තිබුණු අතර, තාවකාලිකව කොන්ත්‍රාත් පදනම මත නිලධාරිනියන් තිදෙනෙකු සේවය කරන බවට නිරීක්ෂණය විය. ගිණුම්කරණ කටයුතු සහ මහජන සම්බන්ධතා පවත්වා ගැනීමේ කටයුතු සඳහා නිලධාරින් දෙදෙනෙකු බඳවා ගත යුතු බවට 2019 ජනවාරි 03 දිනැති 239 වැනි සභා රැස්වීමේදී තීරණය කර තිබුණු අතර 2020 සැප්තැම්බර් 03 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් | කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේනතුවට යවා ඇත. දැනට බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් සභාවේ කටයුතු කරගෙන යාමට තාවකාලික නිළධාරින් අත්‍යවශ්‍ය වේ. | බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරගෙන බඳවා ගැනීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කළමනාකරණ සහකාර තනතුරු 02 ක් අනුමත කර තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුම එම තනතුර සඳහා බඳවාගැනීමේ පටිපාටිය අනුමත කරවාගෙන නොතිබුණි. | | |
| (iv) 38 (ඉ) වගන්තිය | සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සකස්කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. | පනත ප්‍රකාරව රීති සකස් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යැවීමෙන් පසු නිරීක්ෂණ එවා ඇත. එම දෙපාර්තමේනතුව සමග මූලික සාකච්ඡා පවත්වා ඇත. | මැනුම් පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (v) 46 වගන්තිය | සභාව වෙත ඉදිරිපත් කෙරෙන මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳ පැමිණිලි විභාග කිරීම කළ යුතු වුවද 2020 වර්ෂයේදී ලැබී තිබුණු පැමිණිලි 113 න් 80 ක් ද, පසුගිය වර්ෂයේදී ලැබුණු පැමිණිලි 143 න් 104 ක් ද, සමාලෝචිත වර්ෂයේදී ලැබුණු පැමිණිලි 176 න් 134 ක් විසඳා නොතිබුණි. | ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් පනත ප්‍රකාරව නිත්‍යානුකූල දින ගණන් ලබාදී වග උත්තරකාර පාර්ශවයන්ට ප්‍රකාශ ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කල් ලබාදීම, (දින 28 ක කාලයක්), උප කමිටු මගින් පැමිණිල්ල සහ ඒ සම්බන්ධ ලිඛිත සාක්ෂි හොඳින් විමර්ෂණය කොට පාර්ශව කැඳවීම් කිරීම, මසකට වරක් හෝ දෙවරක් පැමිණිලි විභාග කරන අතර පැමිණිලි පාර්ශවය හෝ වග උත්තරකාර පාර්ශවය සාධාරණ හේතු දක්වා නොපැමිණෙන අවස්ථාවන් බහුලව පවතින අතර සභාව තීරණය කර තවදුරටත් අවස්ථා ලබාදීම සිදුකිරීම යන කරුණු හේතුවෙන් පැමිණිලි විසඳීම පිළිබඳ කාර්ය සාධන දර්ශකයක් නිශ්චිත කළ නොහැක.<br>ඉහත ප්‍රධාන කරුණු අනුව ලැබෙන පැමිණිලි සභාවේ පාලනයෙන් බැහැර කරුණු බව වාර්තා කරන අතර සභාවේ මූල්‍ය තත්වය අනුව පැමිණිලි විභාග කිරීමේ වාරගණන වැඩි කිරීමට සභාව සලකා බලමින් ඇත. | මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳ පැමිණිලි විභාග කිරීම කඩිනම් කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

## 1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ දැක්වීම | අදහස් නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තියේ තුන්වන | 2022.11.02 දින මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන | බදු පනත අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| උපලේඛනයේ සඳහන් ආයතන පමණක් බදු ගෙවීමෙන් නිදහස් කර ඇතත්, සභාව එහි සඳහන් ආයතනයක් නොවන බැවින් ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ලද ලිපියට අදාළව සිහිකැඳවීමක් යොමු කර ඇත. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 367,510 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 958,915 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 591,405 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට බලපත්‍ර ආදායම සහ ලියාපදිංචි ගාස්තු යන ආදායම් රු. 1,597,910 කින් අඩුවීම සහ සමස්ත වියදම රු.1,572,036 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

මිනින්දෝරුවරුන් විසින් බලපත්‍ර නැවත අලුත් කරගැනීම් අඩුවීම හේතුවෙන් සහ අලුතෙන් මිනින්දෝරුවරු ලියාපදිංචි නොවීම හේතුවෙන් බලපත්‍ර ගාස්තු සහ ලියාපදිංචි ගාස්තු ආදායම් පහළ ගොස් ඇත. වර්ෂය තුළ නව ස්ථාවර තැන්පතු ආරම්භ කිරීම සහ 2022 වර්ෂයේ සිට උපචිත පදනම මත ස්ථාවර තැන්පතු පොලී ආදායම ගණනය කර ඇති බැවින් ස්ථාවර තැන්පතු පොලී ආදායම ඉහළ ගොස් ඇති අතර 2022 වර්ෂයේ වැඩමුළු පැවැත්වීම හේතුවෙන් වැඩමුළු ශුද්ධ ආදායම ද ඉහළ ගොස් තිබුණි. අනෙකුත් වියදම් තුළ තිබෙන ගැසට් නිවේදන වියදම් ඉහළ යාම හේතුවෙන් අනෙකුත් වියදම් ඉහළ ගොස් තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම වත්කම් අනුපාතය 2021 සහ 2022 වර්ෂවලදී පිළිවෙලින් 2.6 : 1 ක් සහ 2.19 : 1 ද ක්ෂණික වත්කම් අනුපාතය 2021 සහ 2022 වර්ෂවලදී පිළිවෙලින් 2.55 : 1 ක් සහ 2.15 : 1 ක් ද විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ප්‍රධානතම කාර්යයක් වන ඉඩම් මැනුම් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන පැමිණිලි විභාග කිරීම සඳහා සෑම මසකට වරක්ම සභාව රැස්වන අතර, එක් සභා වාරයකදී විභාග කිරීමට ගන්නා පැමිණිලි සංඛ්‍යාව 4 සිට 10 දක්වා පරාසයක පැවතුණි. සමාලෝචිත වර්ෂයේදී සභාවේ වැටුප් හා දීමනා එකතුව සමස්ත වියදමෙන් සියයට 63 ක් විය. එහෙත් ලැබුණු පැමිණිලි 176 න් විභාග කර ඇත්තේ 42ක් එනම්, සියයට 24 ක් පමණි. | කොරෝනා වසංගතයත් සමඟ එම වර්ෂවල පැමිණිලි විසඳා ගැනීමේ කාර්යයේ අඩුවක් ද ඉන් පසුව වියදමෙහි වැඩි වීමක්ද හේතුවිය. සාමාන්‍ය වශයෙන් ගත් කළ මෙම මහජන පැමිණිලි එකිනෙකට වෙනස්, අතිශය අනන්‍යතාවයකින් (Extreme unique) යුක්ත වන අතර ඒවා විභාග කිරීමේදී අධිකරණයකදී මෙන් නොව මහජනතාව /පාර්ශව වෙත අවස්ථාව ලබා දී කටයුතු කිරීමට ඇත. පැමිණිලි විභාගය කොළඹ පිහිටි ඉඩම් මැනුම් සභාවේදී පමණක් සිදුකරන බැවින් පාර්ශව දන්වා / නොදන්වා පරීක්ෂණ සඳහා නොපැමිණීම් ඇත. අනුරාධපුර, පොළොන්නරුව, යාපනය ආදි දුර බැහැර ප්‍රදේශවලින් ද ලැබෙන පැමිණිලි ද එපරිදි විභාග | පැමිණිලි විභාග කිරීම කඩිනම් කිරීමේ ක්‍රමවේදයන් සකසා ගත යුතුය. |

කෙරේ. මෙම පැමිණිලි විභාග කිරීමේ කාර්ය සාධනය සඳහා විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි සංඛ්‍යාමය සහ ගණිතමය වශයෙන් දර්ශකයකින් නිරූපණය කළ හැකි වුවද එය විද්‍යාත්මකව ප්‍රායෝගික වීමට තවත් බොහෝ සාධක සැළකිය යුතුව ඇත. කෙසේ වුවද මෙම පැමිණිලි විභාග කිරීම කඩිනම් කිරීම් සම්බන්ධයෙන් සභාව සාකච්ජාවට බඳුන් කර ඇත.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩාගාර ලේකම්ගේ 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ, රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා නිකුත්කරන ලද අත්පොතෙහි 6.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් තුළදී කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම්, විගණකාධිපතිට ද පිටපත් සහිතව රේඛීය අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් සභාව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ ගිණුම් විගණකාධිපතිට ඉදිරිපත් කරන ලද්දේ 2023 අප්‍රේල් 25 දිනදීය. | 2022.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම් වාර්තා 2022.02.28 දින නියමිත පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කර එහි ඇතුළත්ව තිබූ දෝෂයක් නිවැරදි කර නැවත වාර්තා 2023.04.25 දින ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. |

### 4.2 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩාගාර ලේකම්ගේ 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ, රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා නිකුත්කරන ලද අත්පොතෙහි 6.6 ඡේදය ප්‍රකාරව සභාවේ වාර්ෂික වාර්තාව භාෂා තුනෙන්ම මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් මාස 05 ක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2015, 2016, 2017, 2018, 2019, 2020 සහ 2021 වර්ෂවලට අයත් වාර්තා සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඉදිරිපත් කර නොතිබුණි. | සභාව වාර්ෂික වාර්තා නිසි කලට අදාළ අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇතත් ඒවායේ මුද්‍රණ පිටපත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එහිදී පෙන්වා තිබූ සංශෝධනයන් සිදු කොට නැවත ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇත. කෙසේ වුවද මෙම ගැටළුව ඉඩම් අමාත්‍යාංශය සමඟ සමීපව සන්නිවේදනය කර 2023.05.19 දින වනවිට 2015, 2016, 2017, 2018, 2019, 2020, 2021 සහ 2022 යන වසරවලට අදාළ සියලුම වාර්තා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. ඒවා අනුමත කර ලේකම්වරයා අත්සන් කිරීමෙන් පසු 2023.05.24 දින වනවිට | 2015 සිට වාර්ෂික වාර්තා කඩිනමින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | නැවත මැනුම් සභාවට ලැබී ඇති අතර ඒවායේ නිසි පිටපත් ගණන මුද්‍රණය කර නොපමාව අමාත්‍යාංශයට නැවත භාරදීමට නියමිතව ඇත. | |

**4.3 සංයුක්ත සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| භාණ්ඩාගාර ලේකම්ගේ 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ, රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.3 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා උපායමාර්ගික සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2022 වර්ෂයේ ඉඩම් මැනුම් සභාවේ උපායමාර්ගික සැලැස්මක් පිළියෙල වී නොතිබුණ අතර 2023 වසර සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කර ඇත. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |

**4.4 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| භාණ්ඩාගාර ලේකම්ගේ 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ, රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.3 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල වී නොතිබුණ අතර 2023 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |

**4.5 විගණන කමිටුව**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| භාණ්ඩාගාර ලේකම්ගේ 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ, රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.2 (h) ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කලමනාකරණ රැස්වීම් කාර්තුවකට එක බැගින් 04 ක් පැවැත්විය යුතු වුවත් රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි. | 2022 වර්ෂයේ ඉඩම් මැනුම් සභාවේ විගණන කළමණාකරන රැස්වීම් 03 ක් පවත්වා ඇති අතර රටේ පැතිර පැවති අස්ථාවරත්වයත් ඉන්ධන හිඟය සහ ඊට සම්බන්ධ අවහිරතාවයන් නිසා රැස්වීම් තුන (3) ක් පමණක් පවත්වා ඇත. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |